**ජාතික ශිල්ප සභාව - 2017**

---------------------------------

ජාතික ශිල්ප සභාවේ 2017 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය හා වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1971 අංක 38 දරන මුදල් පනතේ 13(1) වගන්තිය සහ 1982 අංක 35 දරන ජාතික ශිල්ප සභා අනුබද්ධිත පනතේ 84(3) වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. මුදල් පනතේ 14(2)(සී) වගන්තිය ප්‍රකාර සභාවේ වාර්ෂික වාර්තාව සමඟ ප්‍රකාශයට පත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ. මුදල් පනතේ 13(7)(ඒ) වගන්තිය ප්‍රකාරව විස්තරාත්මක වාර්තාවක් 2018 ජුනි 11 දින නිකුත් කරන ලදී.

**1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම**

------------------------------------------------------------------

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

**1.3 විගණකගේ වගකීම**

----------------------

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් උත්තරීතර විගණන ආයතනයන්ගේ ජාත්‍යන්තර විගණන ප්‍රමිතිවලට (ISSAI 1000 – 1810) අනුරූප ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදී. ආචාරධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූල වන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබාගැනීම පිණිස විගණනය සැලසුම්කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව්කිරීම් වලට අදාල වන විගණන සාක්ෂි ලබාගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් අවදානම් තක්සේරු කිරීම්ද ඇතුළත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරුකිරීම් වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස සභාවේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන්නා වූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් සභාවේ අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදාගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීමද විගණනයට ඇතුළත් වේ. විගණනයේ විෂය පථය හා ප්‍රමාණය තීරණය කිරීම සඳහා 1971 අංක 38 දරන මුදල් පනතේ 13 වගන්තියේ (3) සහ (4) උපවගන්තිවලින් විගණකාධිපති වෙත අභිමතානුසාරී බලතල පැවරේ.

මාගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.4 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

**2. මූල්‍ය ප්‍රකාශන**

**2.1 තත්ත්වාගණනය කළ මතය**

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2017 දෙසැම්බර් 31 දිනට ජාතික ශිල්ප සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය සහ සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම**

**2.2.1 ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති**

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 1

අවශ්‍ය කෙරෙන හෝ අවසරදී ඇති විටෙක හැර වත්කම් හා වගකීම් සහ ආදායම් හා වියදම් හිලව් නොකල යුතු වුවත් සමාලෝචිත වර්ෂය තුළ විවිධ පුහුණු වැඩසටහන් සඳහා විවිධ බාහිර ආයතනවලින් ලබාදුන් එකතුව රු.95,000 ක ලැබීම් හා ඒ යටතේ දරන ලද රු.95,000 ක වියදම එකිනෙකට හිලව් කිරීම නිසා එම ආදායම හා වියදම ගිණුම්වල හෙළිදරව් කර නොතිබුණි.

(ආ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 7

(i) වත්කමක් පාවිච්චි කිරීම සඳහා සූදානම් තත්ත්වයට පැමිණි පසු ක්ෂය කිරීම ආරම්භ කළ යුතු වුවත් ශිල්ප සභාව විසින් සමාලෝචිත වර්ෂය තුළ මිලදී ගෙන දැනට භාවිතයේ පවතින එකතුව රු.5,880,485 ක් වටිනා ස්ථාවර වත්කම් සමාලෝචිත වර්ෂය සඳහා ක්ෂය කර නොතිබුණි.

(ii) ජංගම නොවන වත්කම් සඳහා ඵලදායී ජීවිත කාලය වාර්ෂිකව සමාලෝචනය නොකිරීම හේතුවෙන් පිරිවැය රු.578,905 ක් වූ ප්‍රදර්ශන පෙට්ටි හා වෙනත් අයිතම් සම්පූර්ණයෙන් ක්ෂය කර ඇතත් තව දුරටත් ප්‍රයෝජනයට ගනිමින් පැවතුණි. ඒ අනුව වූ ඇස්තමේන්තුගත දෝෂය ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 3 ප්‍රකාරව ප්‍රතිශෝධනය කිරීමට කටයුතු කර නොතිබුණි.

### 2.2.2 ගිණුම්කරණ ප්‍රතිපත්ති

-------------------------

රාජ්‍ය ප්‍රදානයන්ගෙන් මිලදී ගෙන තිබුණු රු.129,087,446 ක් වූ ජංගම නොවන වත්කම් වාර්ෂිකව ක්ෂය කර ඇතත්, ප්‍රාග්ධන ප්‍රදාන ගිණුම්ගත කිරීම සඳහා ගිණුම්කරණ ප්‍රතිපත්තියක් හඳුනාගෙන නොතිබුණි.

### 2.2.3 ගිණුම්කරණ අඩුපාඩු

----------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) රිදී ආශ්‍රිත නිෂ්පාදන ශිල්පීන්ට රිදී මිලදීගෙන ලබාදීම සඳහා 2007, 2008, සහ 2010 යන වර්ෂ වලදී සම්ප්‍රදායික කර්මාන්ත හා කුඩා ව්‍යවසාය සංවර්ධන අමාත්‍යාංශය මඟින් ශිල්ප සභාව වෙත එකතු වටිනාකම රු.13,500,000 ක් ලැබී තිබුණි. දිගුකාලීන බැරකමක් වන මෙම වටිනාකම මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ ජංගම බැරකම් ලෙස සටහන් කර තිබුණි.

(ආ) 2016 වර්ෂයේදී ප්‍රාග්ධන ස්වරූපයේ ලැබීම් හා ගෙවීම් පුනරාවර්තන ස්වරූපයේ ආදායම් හා වියදම් ලෙස ගිණුම්ගත කිරීම සමාලෝචිත වර්ෂයේදී නිවැරදි කිරීම සඳහා යොදන ලද ජර්නල් සටහන හේතුවෙන් රු.713,405 කින් ප්‍රාග්ධන ප්‍රදාන ගිණුම අඩුවෙන් හා සමුච්චිත අරමුදල් ගිණුම වැඩියෙන් දක්වා තිබුණි.

(ඇ) 2015, 2016 සහ 2017 වර්ෂ සඳහා විගණන ගාස්තු වෙනුවෙන් වෙන් කිරීම් කිරීමේදී, සමාලෝචිත වර්ෂය අවසාන දිනට එකතුව රු.1,277,328 ක් අඩුවෙන් විගණන ගාස්තු සඳහා වෙන් කිරීම් සිදු කර තිබුණි.

(ඈ) සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ස්ථාවර තැන්පතු දෙකකට අදාළව පොළී ආදායම් එකතුව රු.330,224 ක් අඩුවෙන් ගිණුම්ගත කර තිබුණි.

### 2.2.4 පැහැදිලි නොකළ වෙනස්කම්

------------------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) ලෙජර් ගිණුම් අනුව සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට විවිධ අත්තිකාරම් ගිණුමේ ශේෂය රු.15,136 ක් වුවද, අත්තිකාරම් උපලේඛනය අනුව එම ශේෂය රු.352,651 ක් වූයෙන් රු.337,515 ක පැහැදිලි නොකළ වෙනසක් පැවතුණි.

(ආ) මූල්‍ය ප්‍රකාශන අනුව සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ස්ථාවර වත්කම් ගිණුම් 08 කට අදාළ ශේෂයන් ස්ථාවර වත්කම් ලේඛනය සමඟ සැසඳීමේදී එකතුව රු.51,046,580 ක පැහැදිලි නොකළ වෙනසක් පැවතුණි.

(ඇ) සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ශිල්ප සභාවේ ලෙජරය අනුව අත්තිකාරම් ගිණුමේ ශේෂය අත්තිකාරම් උපලේඛනය අනුව වූ ශේෂය අතර රු.337,515 ක වෙනසක් වූ අතර එම වෙනස හඳුනා ගැනීමකින් තොරව අවිනිශ්චිත ගිණුමක සටහන් කර උපලේඛනයේ එකතුවෙන් අඩු කර පෙන්වා තිබුණි.

### 2.2.5 විගණනය සඳහා සාක්ෂි නොවීම

පහත සඳහන් එක් එක් ගිණුම් විෂයයන් ඉදිරියෙන් දක්වා ඇති සාක්ෂි විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

| ගිණුම් විෂයය | | වටිනාකම | ඉදිරිපත් නොකළ සාක්ෂි |
|---|---|---|---|
| | | රු. | |
| (අ) | අක්‍රීය බැංකු ජංගම ගිණුම් | 172,926 | වසා දමන ලද ගිණුම් දෙකකට අදාළව බැංකු සැසඳුම් ප්‍රකාශ, මුදල් පොත් |
| (ආ) | ගෙවීම් | 386,920 | වවුචර් පත්‍ර 09 කට අදාළව ඉන්වොයිස් පත් ඇතුළු උපකාරක සාක්ෂි |

## 2.3 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට එකතුව රු.2,597,538 ක් වූ වෙළඳ හා අනෙකුත් ලැබිය යුතු ශේෂයෙන් වසර 03 ට වැඩි ණය ශේෂවල එකතුව රු.2,479,538 ක් වූ අතර, මෙම හිඟ ණය ශේෂ අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට එකතුව රු.2,020,090 ක් වූ වෙළඳ හා අනෙකුත් ගෙවිය යුතු ශේෂයෙන් වසර 02 සිට වසර 03 දක්වා වූ ශේෂවල එකතුව රු.158,685 ක් සහ වසර 03 ට වැඩි ශේෂවල එකතුව රු.1,861,405 ක් සමාලෝචිත වර්ෂය තුළදී ද නිරවුල් කිරීමට පියවර ගෙන නොතිබුණි.

## 2.4 නීති රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණ වලට අනුකූල නොවීම

පහත දැක්වෙන නීති රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම් විගණනයේදී නිරීක්ෂණය විය.

| නීති රීති හා රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම් |
|---|---|
| (අ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය | |
| මුදල් රෙගුලාසි 272 (3) | සියළුම ගෙවීම් සඳහා වවුචර් ඉදිරිපත් කළ යුතු වුවත්, එකතුව රු.1,003,428 ක් වටිනා ගෙවීම් වවුචර් 06 ක් විගණනය සඳහා ඉදිරිපත් කර නොතිබුණි. |
| (ආ) 2015 ජුලි 14 දිනැති අංක 03/2015 දරන මුදල් අමාත්‍යාංශ චක්‍රලේඛය | අත්තිකාරම් පියවීම නිකුත් කරන ලද මුදල් වර්ෂයේ දෙසැම්බර් 31 දිනට වැඩියෙන් ප්‍රමාද නොකළ යුතු වුවත්, 2000 සිට 2016 වර්ෂවල අවස්ථා 08 කදී ලබාදුන් එකතුව රු.258,651 ක අතුරු අග්‍රිම |

සමාලෝචිත වර්ෂ අවසාන දිනටද පියවීම් කර නොතිබුණි.

## 3. මූල්‍ය සමාලෝචනය

-----------------------

### 3.1 මූල්‍ය ප්‍රතිඵල

---------------

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, සමාලෝචිත වර්ෂය සඳහා මූල්‍ය ප්‍රතිඵලය රු.5,336,897 ක ඌනතාවයක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ ඌනතාවය රු.2,122,880 ක් වූයෙන්, ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලයේ රු.3,214,017 ක පිරිහීමක් විය. ඒ සඳහා සභාවේ මුළු ආදායම 2016 වර්ෂයට සාපේක්ෂව රු.693,369 කින් අඩුවී තිබීමත්, මුළු වියදම රු.2,520,649 කින් වර්ධනයවීමත් ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

සමාලෝචිත වර්ෂය හා ඉකුත් වර්ෂ 04 ක මූල්‍ය ප්‍රතිඵල විග්‍රහ කිරීමේදී 2013 වර්ෂයේ සිට 2017 වර්ෂය දක්වා අඛණ්ඩව මූල්‍ය ඌනතාවයක් ඇති වී තිබුණි. කෙසේ වුවද, සේවක පාරිශ්‍රමික, ජංගම නොවන වත්කම් සඳහා වූ ක්ෂයවීම් සැලකිල්ලට ගැනීමේදී සභාවේ දායකත්වය 2013 වර්ෂයේදී රු.59,668,591 ක් වූ අතර, එය අඛණ්ඩව 2016 වර්ෂය වන විට රු.134,641,678 ක් දක්වා වර්ධනය වී සමාලෝචිත වර්ෂයේදී එය රු.127,185,816 ක් දක්වා අඩුවී තිබුණි.

### 3.2 විග්‍රහාත්මක මූල්‍ය සමාලෝචනය

----------------------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) ශිල්ප සභාවේ පසුගිය වර්ෂ 03 ක ජංගම වත්කම් අනුපාතය පරීක්ෂා කිරීමේදී 2015 වර්ෂයේදී 1.85 ක් වූ ජංගම අනුපාතය 2016 වර්ෂය වන විට 2.24 දක්වා වර්ධනය වී තිබූ අතර, එම අනුපාතය සමාලෝචිත වර්ෂයේදී 2.39 ක් විය. සමාලෝචිත වර්ෂයේදී ජංගම වත්කම් අඩුවීමේ ප්‍රතිශතයට වඩා වැඩි ප්‍රතිශතයකින් ජංගම වගකීම් අඩුවී තිබීම මෙම අනුපාතය වර්ධනයට හේතු වී තිබුණි. මේ සඳහා 2016 වර්ෂයේදී රු.8,204,379 ක්ව පැවති ලැබිය යුතු ගිණුම් වටිනාකම සමාලෝචිත වර්ෂය අවසානයට රු.2,597,538 ක් දක්වා අඩුවීමත්, සමාලෝචිත වර්ෂය අවසානයට ජංගම බැරකම් රු.2,125,190 කින් අඩුවීමත් හේතුවී තිබුණි.

(ආ) ක්ෂණික වත්කම් අනුපාතය 2016 වර්ෂයේදී 1.36 ක්ද, 2017 වර්ෂය වන විට 1.44 දක්වා සුළු වර්ධනයක් වී තිබුණි. මෙම අනුපාතයෙහි වර්ධනය සඳහා ජංගම වත්කම් තුළ ඇතුළත් අවසන් තොගය පූර්ව වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේදී රු.600,837 කින් අඩුවීම ප්‍රධාන වශයෙන් හේතුවී තිබුණි.

## 4. මෙහෙයුම් සමාලෝචනය

---------------------------

### 4.1 ක්‍රියාකාරීත්වය හා සමාලෝචනය

--------------------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) පසුගිය වර්ෂ පහක කාලය තුළ ආයතනය විසින් ශිල්පීන් වෙනුවෙන් පවත්වන ලද විවිධ පුහුණු වැඩසටහන් සංඛ්‍යාව හා පුහුණුව ලැබූ සංඛ්‍යාව සැසඳීමේදී 2013 සහ 2014 වර්ෂවල එම සංඛ්‍යාවන් ක්‍රමයෙන් ඉහළ ගොස් තිබුණද, 2015 වර්ෂයේදී එම සංඛ්‍යාවල අඩුවීමක් දක්නට ලැබුණි. 2016 වර්ෂයට සාපේක්ෂව 2017 වර්ෂයේදී පුහුණු වැඩසටහන් සංඛ්‍යාව 13 කින් එනම්, සියයට 12 ක් ලෙස හා පුහුණුව ලැබූ සංඛ්‍යාව 235 කින් එනම්, සියයට 16 කින් පහළ බැස තිබුණි.

(ආ) ඉන්දියානු මහ කොමසාරිස් කාර්යාලයේ රු.23,000,000 ක මූල්‍ය ප්‍රතිපාදන යටතේ යාපනයේ හස්ත කර්මාන්ත නිෂ්පාදන හා අලෙවි ගම්මානයක් පිහිටු වීමට ක්‍රියාකාරී සැලැස්ම අනුව සැලසුම් කර තිබුණද, ඉන්දියානු මහ කොමසාරිස් කාර්යාලයෙන්ම ප්‍රසම්පාදන ලබාදෙන හම්බන්තොට කාවන්තිස්සපුර අලෙවි ගම්මානයේ ඉදිකිරීම් අවසන් නොකිරීම නිසා, යාපනයේ හස්ත කර්මාන්ත ගම්මානයේ ඉදිකිරීම් කටයුතු සඳහා ප්‍රතිපාදන ලැබී නොතිබුණි.

(ඇ) සමාලෝචිත වර්ෂය තුළ දිස්ත්‍රික් ශිල්ප සභා 25 ක් පිහිටු වීමටත්, හම්බන්තොට කාවන්තිස්සපුර හස්ත කර්මාන්ත නිෂ්පාදන හා අලෙවි ගම්මානයේ අදියර II හි ඉදිකිරීම් සියල්ල අවසන් කිරීමටත් 2017 ක්‍රියාකාරී සැලැස්ම අනුව ඉලක්ක කර තිබුණි. නමුත් වර්ෂය තුළ දිස්ත්‍රික් ශිල්ප සභා පිහිටුවීමේ කාර්යය සම්පූර්ණ කර නොතිබූ අතර, හස්ත කර්මාන්ත නිෂ්පාදන හා අලෙවි ගම්මානයේ ඉදිකිරීම් වැඩද අවසන් කර නොතිබුණි.

(ඈ) ක්‍රියාකාරී සැලැස්මට අනුව සමාලෝචිත වර්ෂය තුළ දේශීය වෙළඳ සල්පිල් හා ප්‍රදර්ශන 06 ක් පැවැත්වීමට සැලසුම් කර තිබුණද, කාර්ය සාධන වාර්තා සහ සත්‍ය ක්‍රියාකාරීත්වය අනුව වෙළඳ ප්‍රදර්ශන හා සල්පිල් 03 ක් පමණක් පවත්වා තිබීම නිසා ලඟා කරගත් භෞතික ප්‍රගතිය ක්‍රියාකාරී සැලැස්මෙන් සියයට 50 ක මට්ටමක පැවතුණි.

(ඉ) 2017 වර්ෂය තුළ ශිල්ප සංගම් පිහිටුවීම හා සංගම් ප්‍රතිසංස්කරණය කිරීම් යටතේ සංගම් 50 ක් පිහිටුවීම හා ප්‍රතිසංස්කරණය කිරීමට ඉලක්ක කර තිබුණද, වර්ෂය තුළ සංගම් 28 ක කාර්යය පමණක් ඉටුකිරීම නිසා ලඟා කරගත් භෞතික ප්‍රගතිය සියයට 56 ක මට්ටමක පැවතුණි.

(ඊ) කාර්යසාධන වාර්තා අනුව පැළ වගා කිරීමේ භෞතික ප්‍රගතිය පැළ 4,000 ක් ලෙස දක්වා තිබුණද ක්‍රියාකාරී සැලැස්ම තුළ පැළ වගා කිරීමේ ඉලක්කයන් දක්වා නොතිබුණි. ඒ නිසා එහි ලඟා කරගත් ප්‍රගතිය හඳුනාගත නොහැකි විය.

## 4.2 කළමනාකරණ ක්‍රියාකාරකම්

---------------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) ගම්මාන සංවර්ධන වැඩසටහන යටතේ ගම්මාන 06 ක් සඳහා බෙදා දීමට සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් මාසයේදී එකතුව රු.8,373,920 ක් වටිනා මහන මැෂින්, සකපෝරු, විදුලි මෙවලම් හා උපකරණ මිලදීගෙන තිබුණද විගණන දිනය වූ 2018 අප්‍රේල් දක්වාම එම ද්‍රව්‍ය හා උපකරණ ශිල්පීන්ට බෙදා දීමට කටයුතු කර නොතිබුණි.

(ආ) 2009 ජනවාරි 08 දිනැති අංක අමප/08/2322/349/015 දරන අමාත්‍ය මණ්ඩල තීරණය අනුව ශ්‍රී ලංකා හස්ත කර්මාන්ත මණ්ඩලය යටතේ දිවයින පුරා පිහිටි ජාතික ශිල්ප සභාව වෙත පවරාගත හැකි ශිල්පීය පුහුණු මධ්‍යස්ථාන 86 ක් සහ එහි දේපළ සභාව වෙත භාරදී තිබූ නමුත්, එම පුහුණු මධ්‍යස්ථානවලින් මධ්‍යස්ථාන 85 ක ඉඩම් හා ගොඩනැගිලි නීත්‍යානුකූලව ශිල්ප සභාව වෙත පවරාගෙන ශිණුම්ගත කිරීමට කටයුතු කර නොතිබුණි.

(ඇ) ශිල්ප අභිමානී - 2017 සහ ජාත්‍යන්තර අත්කම් උළෙල - 2017 සඳහා සමරු තිළිණ මිලදී ගැනීමේදී අවශ්‍යතාව නිවැරදිව හඳුනා නොගෙන සමරු තිළිණ මිලදී ගැනීම නිසා සමාලෝචිත වර්ෂය අවසාන දිනට එකතුව රු.49,500 ක් වටිනා සමරු තිළිණ 19 ක් වැඩියෙන් මිලදීගෙන තිබුණි.

(ඈ) රේඛීය අමාත්‍යාංශය මඟින් ව්‍යවසායකත්ව ගම්මාන සංවර්ධන වැඩසටහන යටතේ සමාලෝචිත වර්ෂය තුළ එකතුව රු.16,118,325 ක් ලැබී තිබූ අතර, ඒ සඳහා එකතුව රු.16,766,788 ක් වියදම් කිරීම නිසා රු.648,463 ක් ලැබීම් ඉක්මවා වියදම් කර තිබුණි.

(ඉ) ශිල්ප සභාවේ ප්‍රධාන කාර්යාලය ඉදිකර ඇති රෝහිනා මාවතේ පිහිටි රූඩ් 02 පර්චස් 1.58 ක් වූ ඉඩම 1990 ඔක්තෝබර් 16 දිනැති අංක 140 දරන බදු ඔප්පුව මඟින් ශිල්ප සභාව වෙත හිමිවී තිබුණි. මෙම ඉඩමේ මායිම් සම්බන්ධයෙන් මතභේදාත්මක තත්ත්වයක් ඇති වී තිබුණත්, සමාලෝචිත වර්ෂය තුළදීද එය නිරවුල් කර නොතිබුණි.

## 4.3 මතභේදයට තුඩුදෙන ගනුදෙනු

වර්ෂ කිහිපයක සිට අක්‍රියව පැවති බැංකු ජංගම ගිණුම් දෙකක් සමාලෝචිත වර්ෂය තුළ වසා දැමීමේදී එම බැංකු ගිණුම් දෙකෙහි ශුද්ධ ශේෂය ලෙස රු.116,804 ක හිඟයක් පෙර වර්ෂයේ ලාභයට එරෙහිව කපා හැර තිබූ අතර මුදල් ගිණුමේ ශේෂයෙන් වියදමක් ලෙස අඩුකර දක්වා තිබුණි.

## 4.4 නිෂ්ක්‍රීය හා ඌන උපයෝජිත වත්කම්

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) ශිල්ප සභාව මඟින් පාලනය වන සීගිරිය ශිල්ප ගම්මානයේ ඇති ගොඩනැගිලි 03 ක් සහ අලෙවි කුටි 11 ක් වසර තුනකට වැඩි කාලයක් තිස්සේ ප්‍රයෝජනයට නොගෙන නිෂ්කාර්යව පැවතුණි.

(ආ) රිදී ආශ්‍රිත නිෂ්පාදන කර්මාන්තයේ නිරත ශිල්පීන්ට භාණ්ඩ නිෂ්පාදනයේදී භාවිතා කිරීම සඳහා ලබාදීමට 2007 – 2010 කාලය තුළ අමාත්‍යාංශ ප්‍රතිපාදන මත මිලදී ගත් එකතුව රු.13,218,660 ක වටිනාකම ඇති රිදී කිලෝ ග්‍රෑම් 97.92 ක්, ශිල්පීන් වෙත අලෙවි කිරීමට නොහැකිව වර්ෂ 07 කට වැඩි කාලයක සිට නිෂ්කාර්යව පැවතුණි.

(ඇ) ග්‍රාමීය ආර්ථික කටයුතු අමාත්‍යාංශය විසින් 2015 ජූනි 03 දින ශිල්ප සභාව වෙත ලබාදුන් වාහන 05 ක් ධාවනයට නොසුදුසු තත්ත්වයේ පැවතීම මත 2017 දෙසැම්බර් 31 දින වන විට ප්‍රධාන කාර්යාල භූමියේ අනාරක්ෂිතව, නිෂ්ක්‍රීයව ගාල් කර තිබුණි.

## 4.5 කාර්ය මණ්ඩල පරිපාලනය

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) ශිල්ප සභාවේ අනුමත කාර්ය මණ්ඩලය 262 ක් වුවද, සත්‍ය කාර්ය මණ්ඩලය 230 ක් වූයෙන්, ජ්‍යෙෂ්ඨ මට්ටමේ 05 ක්, ද්විතීය මට්ටමේ 38 ක්, තෘතීයික මට්ටමේ 01 ක් පුරප්පාඩුවී පැවති

අතර, ප්‍රාථමික මට්ටමේ කාර්ය මණ්ඩලයේ අනුමත සංඛ්‍යාව 21 ක් වුවද, තත්‍ය කාර්ය මණ්ඩලය 27 ක් වූයෙන් එම සේවකයින් 06 ක අතිරික්තයක් පැවතුණි.

මෙම කාර්ය මණ්ඩල ඌනතාව සමාලෝචිත වර්ෂය අවසාන දිනට පියවීමට ක්‍රියා කර නොතිබීම නිසා ආයතනයේ කාර්යය භාරය කඩිනමින් ඉටු කිරීමේ ප්‍රමාදයන් නිරීක්ෂණය විය. 2018 වර්ෂය වන විට පුරප්පාඩු සඳහා සේවකයින් බඳවා ගැනීමට කටයුතු කරමින් සිටින බව නිරීක්ෂණය විය.

(ආ) ගිණුම් හා ප්‍රසම්පාදන නිලධාරි තනතුරෙහි සේවය කළ නිලධාරියා 2014 පෙබරවාරි මාසයේදී සේවයෙන් ඉල්ලා අස්වී තිබුණද, එම තනතුර සඳහා ස්ථිර සේවකයෙකු බඳවා ගැනීමට කටයුතු කර නොතිබුණි.

## 5. තිරසාර සංවර්ධනය

## 5.1 තිරසර සංවර්ධන අරමුණු ළඟා කර ගැනීම

තිරසර සංවර්ධනය පිළිබඳ එක්සත් ජාතීන්ගේ වසර 2030 "න්‍යාය පත්‍රය" ප්‍රකාරව සෑම රාජ්‍ය ආයතනයක් විසින්ම කටයුතු කළ යුතුව පවතින අතර සමාලෝචිත වර්ෂයට අදාළව ශිල්ප සභාව විසින් තම විෂය පථය යටතට ගැනෙන කාර්යයන් සම්බන්ධයෙන් කෙසේ ක්‍රියාත්මක විය යුතුද යන්න පිළිබඳව දැනුවත් වී තිබුණි. මීට අදාලව පහත කරුණු නිරීක්ෂණය විය.

(අ) ජාතික ශිල්ප සභාව 2017 වර්ෂයේදී තිරසාර සංවර්ධන ඉලක්ක කරා ළඟා වීමට "දිළිඳුකම පිටු දැකීම" යන අරමුණ තෝරාගෙන තිබුණි. ඒ අනුව එම අරමුණු කරා ළඟා වීමට ඉලක්ක සහ දර්ශකයන් හඳුනාගෙන තිබූ නමුත්, සමාලෝචිත වර්ෂයේ ක්‍රියාකාරී සැලැස්ම තුළ පැහැදිලිව තිරසාර සංවර්ධන අරමුණු හා ඉලක්ක ළඟා කර ගැනීම සඳහා මූල්‍ය ප්‍රතිපාදන, මානව සම්පත් සහ භෞතික සම්පත් හඳුනාගෙන නොතිබුණි.

(ආ) ශිල්ප සභාව පිහිටුවීමේ පනත ප්‍රකාරව ඉටු කළ යුතු අරමුණු හා පරමාර්ථ වලට අදාළව අඛන්ඩව ඉටු කළ කාර්යය භාරයම සමාලෝචිත වර්ෂය තුළදී ද ක්‍රියාකාරී සැලැස්මට ඇතුළත් කර තිබූ අතර, එම කාර්යය භාරයම තිරසාර සංවර්ධන අරමුණු කරා ළඟා වීමට පදනම් කරගත් ඉලක්ක හා දර්ශක ලෙස විගණනයට වාර්තා කර තිබුණි. ඒ අනුව තිරසාර සංවර්ධන අරමුණු ළඟා කර ගැනීම සඳහා විශේෂිත අවධානයක් යොමු කර නොතිබුණි.

## 6 ගිණුම් කටයුතුභාවය හා යහපාලනය

## 6.1 අයවැය පාලනය

සමාලෝචිත වර්ෂය තුළ පුනරාවර්තන වැය විෂයයන් 07 ක ප්‍රතිපාදනය ඉක්මවා දරන ලද තත්‍ය වියදම්වල සියයට 47.7 සිට සියයට 80.4 ක් දක්වා වූ පරාසයක විචලනයන් පැවති අතර, සංවර්ධන වැඩ සඳහා දරන ලද වැය විෂයයන් 03 ක ප්‍රතිපාදන මුදල ඉක්මවා දරන ලද තත්‍ය වියදම් වල සියයට 32 සිට සියයට 67.6 දක්වා වූ පරාසයක විචලනයන් පැවතුණි. ඒ හේතුවෙන් අයවැය ලේඛණය ඵලදායී කළමනාකරණ පාලන කාරකයක් ලෙස උපයෝගී කරගෙන නොතිබුණු බව නිරීක්ෂණය විය.

## 6.2 නොවිසඳී ඇති විගණන ඡේද

----------------------------------

2012 වර්ෂයේදී ශිල්ප සභා භූමියේ ශිල්ප ගම්මානයට පිවිසීම සඳහා රු.1,274,649 ක් වැය කර ඉදිකරන ලද දැව පාලම විවෘත කිරීමටත් පෙර වෙනත් සංවර්ධන කටයුත්තක් සඳහා කඩා ඉවත් කර තිබුණි. මෙම වත්කම් ගිණුම් පොත්වලින් කපා හැරීමට කටයුතු කර නොතිබුණි.

## 7. පද්ධති හා පාලනයන්

-----------------------

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු වරින්වර සභාවේ සභාපතිනියගේ අවධානයට යොමු කරන ලදී. පහත සඳහන් පාලන ක්ෂේත්‍ර සම්බන්ධයෙන් විශේෂ අවධානය යොමු කළ යුතු වේ.

| පද්ධති හා පාලන කේෂ්ත්‍ර | නිරීක්ෂණ |
|---|---|
| (අ) මූල්‍ය පාලනය | ලැබිය යුතු ශේෂ අයකර නොගැනීම සහ බැංකු සැසඳුම් තුළ නිරවුල් නොකළ ශේෂ පැවතීම. |
| (ආ) ස්ථාවර වත්කම් පාලනය | වත්කම් ලේඛන නිසි පරිදි නඩත්තු නොකිරීම, ශිල්පීය පුහුණු මධ්‍යස්ථානවල වත්කම් පවරා නොගැනීම සහ සමීක්ෂණය කිරීම ප්‍රමාද වී සිදු කිරීම. |
| (ඇ) ගබඩා පාලනය | ගබඩා ද්‍රව්‍ය සහ ප්‍රදර්ශන භාණ්ඩ තොග පාලනය යාවත්කාලීනව නොකිරීම. |
| (ඈ) ණයගැති හා ණයහිමි පාලනය | හිඟ ණය ශේෂ අයකර නොගැනීම සහ ගෙවිය යුතු ශේෂ නිරවුල් කිරීමට කටයුතු නොකිරීම. |